# තලවාකැලේ - ලිඳුල නගර සභාව

## නුවරඑළිය දිස්ත්‍රික්කය

------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 පෙබරවාරි 20 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව2015 ජූලි 06 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ - ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ලැබිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02ක එකතුව රු.50,595,587ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.14,153,494 ක් වී තිබුණි.

1.3.2 ගෙවිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 03ක එකතුව 60,801,927ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.18,182,556 ක් වී තිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

(අ) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.116,092ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂාකිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශවලින් ව්‍යාපෘති 08ක් සඳහා ලැබිය යුතු වසර 01 සිට 13ක කාල පරාසයකට අයත් රු.1,064,602ක මුදල තව දුරටත් ලැබිය හැකි බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

1.3.4 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

--------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.6 වගන්තිය | සභාවේ සේවයේ නියුතුව සිට මියගොස් ඇති හා විස්තර හඳුනාගත නොහැකි සේවකයන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු212,233ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 වගන්තිය | තැන්පත් කර වසර 02ක් ඉක්මවූ රු.5,74,254 ක් වටිනා තැන්පත් මුදල් රෙගුලාසි ප්‍රකාරව නීයාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,466,729ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,085,826ක් වූයෙන් අතිරික්තයේ රු.2,619,097ක අඩුවීමක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමඟ සැසඳීමේදී රු.2,619,097ක අඩුවීමක් විය. ඒ සඳහා 2014 වර්ෂයේදී ආදායම් විෂයයන් 03ක ආදායම සියයට 01 සිට සියයට 55ක පරාසයකින් අඩුවීමත් වියදම් විෂයයන් 04ක වියදම සියයට 16 සිට සියයට 235 දක්වා වූ පරාසයකින් වැඩිවීමත් හේතු වී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | | | 2014.12.31 දිනට හිඟ | | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂය | 2014.01.01 දිනට හිඟය | 2014.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2014.01.01 දිනට පැවති හිඟයෙන් | වර්ෂයේ බිල්කිරීම් වලින් | මුළු හිඟය |
| | | | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 3,866,081 | 2,616,662 | 6,912,939 | 4,138,297 | 1,249,419 | 2,774,641 | 2,774,642 |
| කඩ කුලී | 462,003 | 13,893 | 2,801,070 | 2,606,697 | 448,110 | 194,372 | 642,482 |
| බලපත්‍ර ගාස්තු | - | - | 1,598,700 | 1,598,700 | - | - | - |
| වෙනත් | 77,623 | 47,486 | 1,469,359 | 1,368454 | 30,137 | 100,904 | 138,541 |

### 2.3.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.2,774,642ක මුදල් අයකර ගැනීම සඳහා නගර සභා ආඥාපනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.351,500ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම
----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වීම තහවුරු කරගැනීම සඳහා පිළියෙල කර තිබූ භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා මගින් කාර්යය සාධනය තහවුරු කර ගැනීමට අපහසුවිය.

3.2 අවිධිමත් ගනුදෙනු
---------------------------------

අංක CPPB-8670 දරණ නගර සභාවට අයත් මයික්‍රෝ වර්ගයේ කැබ් රථය රු.324,846කට අළුත්වැඩියා කර ඇතත්, යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගේ නිර්දේශය ලබාගෙන නොතිබුණි.

3.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්
--------------------------------------------------

(අ) 2006 වර්ෂයේ මිලදීගත් රු.131,450ක් වටිනා කසල කැබලි කරන ඇග්‍රිටෙක් මල්ටි චොපර් යන්ත්‍රය වසර 07ක කාලයක් ඉක්මවා ගොස් ඇතත් 2014 දෙසැම්බර් 31 දින තෙක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව තබා තිබුණි.

(ආ) සභාව 2014 මාර්තු 07 දින සභා තීරණය අනුව රු.390,000ක් වටිනා ජල බවුසරයක් මිලදි ගැනීම සඳහා 2014 ජූලි 24 දින රු.100,000ක් ගෙවා තිබුණි. නිශ්චිත ප්‍රයෝජනයක් රහිත එවැනි ජල බවුසරයක් නගර සභාව තුල තිබියදී විධිමත් ටෙන්ඩර් ක්‍රමවේදයකින් පරිබාහිරව තවත් ජල බවුසරයක් මිලදී ගෙන මාස 08කට අධික කාලයක් නිශ්කාරයව තබා ගිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභාව විවිධ මාර්ග වලින් ලබා ගන්නා අරමුදල් මගින් ඉදිකරමින් පවතින මහල් තුනකින් යුත්ත සේවා පියස සඳහා 2014 සැප්තැම්බර් 24 දින වන විට රු.8,368,886ක් වියදම් කර තිබුණි. 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන උල්ලංගණය කරමින් අදියර 4ක් යටතේ ප්‍රදේශයේ සමිති මගින් කාර්මික නිලධාරියාගේ ඇස්තමේන්තු සීමාව ඉක්මවා ඉදිකරනු ලබන මෙම ගොඩනැගිල්ල සඳහා විධිමත් සැලැස්මක් සහ ඇස්තමේන්තුවක් පිළියෙළ කර නොතිබුණ අතර, පරීක්ෂණ දින

වන විට මෙම ගොඩනැගිල්ල සඳහා සවිකර තිබෙන උපාංග නියමිත ප්‍රමිතියෙන් නොතිබූ බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) අඩු ආදායම් ලාභී පළාත් පාලන ආයතනවල සංවර්ධන කාර්යය සඳහා මධ්‍යම පළාත් සභාව මගින් ලබාදුන් ප්‍රතිපාදනවලින් රු.1,885,376ක් වියදම්කර ඉදිකර තිබූ මිඩ්ල්ටන් සංචාරක ගිමන්හල සඳහා යොදා තිබුණු උපාංග හා සවිකිරීම් නියමිත ප්‍රමිතියෙන් නොතිබුණි. මෙම කරුණ විගණනයෙන් පෙන්වාදුන් පසු උසස් ප්‍රමිතියෙන් යුක්ත උපාංග සවිකරන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා තිබුණි.

3.5 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 07ක සියයට 5 සිට සියයට 213 දක්වාද වියදම් විෂයයන් 06ක සියයට 18 සිට සියයට 246 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.

(ආ). අභ්‍යන්තර පාලනය.

(ඇ). ආදායම් පරිපාලනය

(ඈ). ණයගැති ණයහිමි පාලනය.

(ඉ). වත්කම් කළමනාකරණය